## වාහල්කඩ

# ජනපතිනිය හොඳ ආයුධ අතහැර මොට්ට ආයුධ අතට ගනියි

ශ්‍රී ලංකාව - ආසියාකරයේ තවත් රටවල් කීපයක් සමග මුහුණ දුන් සුනාමි ඛේදවාචකයට මේ වන විට මාස තුනක් ඉක්ම ගොස් තිබේ. දූන් ඉන් විපතට පත් ජනතාවට හැර අනෙකුත් අයට සුනාමිය අමතකය. එහෙත් සුනාමියෙන් ඇතිවූ අලාභ පාඩු මේ වන විට යථා තත්වයට පත්ව ඇතැයි ඉන් කියැවෙන්නේ නැත. ලක්ෂ සංඛ්‍යාත පිරිසක් තවමත් කූඩාරම්වල හෝ ගස් ගල් යට සිටිද්දී රටේ දේශපාලන හා මාධ්‍යයන් තුළ අවධානය යොමු වී ඇත්තේ නිදහස් සන්ධානයේ අර්බුද, ජනාධිපතිවරණයක් පවත්වන්නේද? ජනමත විචාරණයක් පවත්වන්නේද? මම තව දුරටත් බලයේ සිටින්නේ කෙසේද? වැනි කරුණුය.

ආණ්ඩු බලයේ සිටින එක්සත් ජනතා නිදහස් සන්ධානයේ ප්‍රධාන පර්ශවකරුවන් වන ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා ජනතා විමුක්ති පෙරමුණ අතර මතුව තිබෙන අර්බුදය මේ දිනවල මෙරට මාධ්‍යයන්ට 'රස' කෑමක් වී තිබේ. ඇත්ත වශයෙන්ම මෙම අර්බුදය පවතින්නේ මෙම පක්ෂ දෙක අතර නොව, ජනාධිපතිනිය හා ඇගෙ සමීප උපදේශකයන් කිහිප දෙනෙකුත් නියෝජ්‍ය ඇමතිවරුන් කිහිප දෙනෙකුත් ජනතා විමුක්ති පෙරමුණත් අතරය.



සන්ධානයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට පිටතින් පෞද්ගලීකරණය, සාම සාකච්ඡා ආරම්භ කිරීම ආදී කරුණුවලට ජනතා විමුක්ති පෙරමුණ ප්‍රසිද්ධියේම විරෝධය එල කොට ඇත. මෙම අර්බුදය රටට පෙනෙන්නට පටන් ගත්තේ ජනාධිපතිනිය ජනමාධ්‍ය අමාත්‍යංශයේ කටයුතු සිය පාලනයට යටත් කර ගැනීමත් සමගය.

පවතින ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිනිය ලබන වසරේ දේශපාලනයෙන් විශ්‍රාම ගත යුතුය. එක්සත් ජාතික පක්ෂය පවසන අන්දමට ඇය විශ්‍රාම ගත යුත්තේ මේ වසරේය. කෙසේ හෝ ඇයට මින් ඉදිරියට ක්‍රියාකාරී දේශපාලනයේ යෙදීමට නොහැකිය. වත්මන් අගමැති මහින්ද රාජපක්ෂ රට වටේ ඇවිදිමින් පක්ෂය තුළත් රට තුළත් සිය ප්‍රතිරූපය වර්ධනය කර ගැනීමේ දුවැන්ත ව්‍යාපෘතියක නියලී සිටින්නේ මේ නිසාය. එහෙත් දූන් පෙනෙන්නට තිබෙන අන්දමට ජනාධිපතිනිය ජනාධිපතිකම අතහැර පැන්ෂන් යන්නට සූදානම් නැත. ඇයගේ උත්සාහය වී ඇත්තේ ජනමත විචාරණයකින් විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කර විධායක අගමැති වශයෙන් පාර්ලිමේන්තුවට එන්නටය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් සඳහා පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක් අවශ්‍ය නමුත් ජනාධිපතිනියගේ උත්සාහය වනු ඇත්තේ පාර්ලිමේන්තුවේ සාමාන්‍ය බහුතරය හා ජනමත විචාරණයක අනුමැතිය මත ව්‍යවස්ථා සංශෝධනය කිරීම හා එය නිවැරදි යැයි ශ්‍රේෂ්ඨාධිකරණයෙන් තීන්දුවක් ගැනීම විය යුතුය.

සැලසුමක් ලෙස නම් මෙය ඉතා හොඳය. ජනාධිපතිනිය අපේක්ෂා කරනු ඇත්තේ තමන් අමාත්‍යංශ පවරාගෙන පාර්ලිමේන්තුව විසුරුවා මැතිවරණයකට ගොස් බලය ගත්තාක් මෙන් මෙම සැලසුමත් ඉතා පහසුවෙන් කළ හැකිවනු ඇති බවය.

ජනාධිපතිනිය අමාත්‍යංශ පවරා ගන්නා අවස්ථාව වන විට ඇයගේ එම ක්‍රියාව සාධාරණීකරණය වන තරමට එක්සත් ජාතික පක්ෂයට එරෙහි විරෝධය උත්සන්න වී තිබුණි. එක්සත් ජනතා නිදහස් සන්ධානය බලයට පැමිණීම දක්වා ක්‍රියාවලිය සාර්ථක වූයේ ඒ නිසාය. එහෙත් මේ වන විට රට තුළ අප්‍රසාදය ගොඩ නැගෙමින් පවතින්නේ එජාපය සම්බන්ධයෙන් නොව ආණ්ඩුව සම්බන්ධයෙනි. ආණ්ඩුව ආරම්භයේදී වැව් ප්‍රතිසංස්කරණය අරඹමින්, උපාධිධාරීන්ට රැකියා දෙමින්, පොහොර සහනාධාරය දෙමින් ආරම්භ කළ වැඩ පිළිවෙළ පිළිබඳ විශ්වාසය තැබුණි. මේ වන විට ආණ්ඩුව සම්බන්ධයෙන් ඇති ජනතා විශ්වාසය පලුදු වන්නට පටන් ගෙන තිබේ. සුනාමි ව්‍යසනය හමුවේ ආණ්ඩුව කටයුතු කළ ආකාරය ඊට බොහෝ සේ බලපෑවේය. ආණ්ඩුවේ ප්‍රධාන පාර්ශවකරුවා වශයෙන් ජනතා විමුක්ති පෙරමුණ ඉතිරි දැක්මක් හා වැඩ පිළිවෙළක් සහිතව සුනාමි ව්‍යසනයට මුහුණ දෙන්නට උත්සාහ කළද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඇතැම් මැති ඇමතිවරුන්ගේ අන්තවාදී කටයුතු නිසා එයින්ද සැලකිය යුතු ජන ප්‍රසාදයක් අත්කර ගන්නට ආණ්ඩුව අසමත් විය.

ආණ්ඩුවේ මෙම අර්බුදවලට සාපේක්ෂව නොවුණද විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ, ශ්‍රී ලංකාවේ මීළඟ විධායක ජනාධිපතිවරයා වීම සඳහා සූක්ෂම අන්දමින් සැලැසුම් කරමින් සිටී. ඔහුගේ ඒ සැලසුම් වතුරේ යන තත්වයක් ඇති වූයේ ජනාධිපතිවරණයක් නොපවත්වා විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ ජනාධිපති සැලසුම සමඟිනි. එහෙත් මේ වන විට රනිල් වික්‍රමසිංහ ද හොඳ උපක්‍රමයක් තෝරා ගෙන තිබේ. හැම විටම අනුන් ලවා කොස් ඇට බාවන්නට දක්ෂ රනිල් වික්‍රමසිංහ ජනමත විචාරණයට ද ජනතා විරෝධය ගොනු කිරීමේ උත්සාහයක යෙදී සිටී. ඔහු පවසන්නේ තමන් ජනමත විචාරණයට විරුද්ධ බව නොව, ඒ සඳහා රුපියල් කෝටි 100ක මුදලක් වැය කිරීම අපරාධයක් බවය. එම මුදලින් නිවාස අහිමිවූවන්ට නිවාස තනා දෙන ලෙස ඔහු යෝජනා කර තිබේ.

ඒ අනුව බලන විට ජනාධිපතිනියගේ දේශපාලන සටනේ ප්‍රධාන සතුරා සමග සසඳන විට ඇයට එතරම් වාසි සහගත තත්වයක් ඇති බැව් පෙනෙන්නට නැත. යුද්ධයකට යා යුත්තේ සතුරා දුර්වල විටය. නැතහොත් තමන් සතුරාට වඩා ශක්තිමත් විටය. භූමියේ වැඩි වාසිය තමන් සතුව ඇති විටය. මේ වන විට ජනාධිපතිනියගේ භූමියේද එතරම් වාසි සහගත බවක් දක්නට නැත. අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ ජනාධිපතිධූරය සඳහා සිහින දකිමින් වෙනම ගමනක නිරත වී සිටී. ඔහුට ඒ සඳහා අවස්ථාවක් නොලැබීම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළ භේදයකට හේතුවිය හැක. මහින්ද රාජපක්ෂට අගමැතිධූරය පිරිනමා එම අවිනිශ්චිතභාවයට මඟ පාදනු ලැබුවේ ද ජනාධිපතිනියමය.

සාම සාකච්ඡා යළි ආරම්භ කිරීම සඳහා ප්‍රවේශයක් දුන් සුනාමියෙන් විනාශ වූ උතුරු නැගෙනහිර යළි ගොඩ නැගීම සඳහා එල්.ටී.ටී.ඊ සංවිධානයේ නියෝජනයක් සහිතව ඒකාබද්ධ යාන්ත්‍රණයක් සකස් කිරීම පිළිබඳ කතාබහක් මේ දිනවල සිදුවෙමින් පවතී. පසුගිය දිනෙක විදේශ අමාත්‍ය ලක්ෂ්මන් කදිරගාමර් බීබීසී රූපවාහිනියට කී අන්දමට මේ සාකච්ඡා සඳහා න්‍යාය පත්‍ර සැකසීමට කාලය නොවුණද ජනාධිපතිනිය මේ හරහා ද උත්සාහ දරන්නේ ජනමත විචාරණය සඳහා එල්.ටී.ටී.ඊ සහය ලබාගැනීමටය. එය කෙසේ සාර්ථක වනු ඇත්ද යන්න ගැන කිව නොහැකි නමුත්, මේ හරහා ඇය තමන්ට ශක්තියක් වූ විදේශ අමාත්‍ය ලක්ෂ්මන් කදිරගාමර් මෙන්ම ජනතා විමුක්ති පෙරමුණේ සහාය අහිමි කරගැනීමේ අවදානමකට ලක්ව සිටින්නීය. මේ ඒකාබද්ධ යාන්ත්‍රණය කරලියට එන්නේ අන්තර් පාලනය මුලින් සාකච්ඡා කිරීමට ආණ්ඩුව සූදානම් බවට ජනාධිපතිනියගේ සාම නියෝජිත ජයන්ත ධනපාල නිකුත් කළ නිවේදනය අකුලා ගැනීමට සිදුවීම නිසාය.

ජනතා විමුක්ති පෙරමුණ හා ජනාධිපතිනිය අතර විරසකය මේ වන විට ඉතා උග්‍ර වී ඇත. ඒ හරහා ඇගෙ විශ්වාසවන්තයෙකු වූ මංගල සමරවීරගේ සහයද ඇයට නොලැබෙන තත්වයක් පවතී. මංගල වෙනුවට ඇය තෝරාගෙන ඇත්තේ අසාර්ථක දේශපාලකයෙකු වන ඩිලාන්ය. ඉදිරියේ දී මංගලට ජනමාධ්‍ය ඇමතිකම අහිමි වන්නට ඉඩ ඇතැයි ද පුවත් පලව තිබේ.

මේ අනුව බලන විට ජනමත විචාරණයෙන් ජය ගන්නට දූනට ජනාධිපතිනිය ශක්තිමත් නැත. එය ජය ගන්නට නම් රනිල් දුර්වල විය යුතුය. එහෙත් තුන්වන ලෝකයේ දේශපාලනයක් ඇති ශ්‍රී ලංකාවේ සැලසුමකින් තොර ආණ්ඩුවක් සිටියදී විපක්ෂයට ප්‍රබල වන්නට එතරම් කලක් ගත වන්නේ නැත. එසේ නම් කළ යුත්තේ තමන් සතුරාට වඩා ශක්තිමත් වීමය. ඒ සඳහා හොඳම ආයුධ තෝරා ගත යුතුය. නමුත් ජනාධිපතිනිය දූන් කරමින් සිටින්නේ තමන් සතු හොඳම ආයුධ අතහරිමින් මොට්ට ආයුධ අතට ගැනීමය. එහෙත් ඇය තවමත් ප්‍රමාද නැත.

**ධනුද්ධර**

# ඇමරිකානු ජනාධිපතිවරයෙක් ගැන කතාවක්

ඇමෙරිකාවෙ හිටිය රූස්වෙල්ට් කියල ජනාධිපතිවරයෙක්... බොහොම අපූරු වැඩකරපු කෙනෙක්...

රූස්වෙල්ට්ගෙ කාලෙදි ඇමෙරිකාවෙ පැක්ටෙරියක ප්‍රශ්නයක් ඇතිවෙලා ස්ට්‍රයික් එක දිගින් දිගට ඇදෙන්ඩ පටන්ගත්ත...

බේරාගන්ඩ බැරිම තැන පැක්ටරි අයිතිකාරයා රූස්වෙල්ට් හම්බවෙන්න ගියා.

රූස්වෙල්ට් ජනාධිපතිතුමා කාර්යාලයේ ඉන්නවා මොකක්දෝ වැඩක් කර කර...

"සර්... මගෙ පැක්ටෙරියේ කම්කරුවො හරියට වැඩ කරන්නෙ නෑ... නිකං ඉන්නවා... ඊට පස්සෙ ඕවර් ටයිම් කරනවා... යුනියන් එකක් දාගෙන මාව විනාශ කරන්ඩයි යන්නේ... මම දෙතුන් දෙනෙක්ම දොට්ට දැම්මා..."

කතාව අහගෙන ඉඳලා රූස්වෙල්ට් හෙමින් සැරේ මෙහෙම කිව්වා.

"ඔව්... ඒ කතාවෙ ඇත්තක් තියෙනව."

ඊට පස්සේ පැක්ටරි හිමියා පිටවෙලා ගියා... කම්කරු නියෝජිතයො පිරිසක් රූස්වෙල්ට් හම්බවෙන්ඩ ආවා... ඇවිත් මෙහෙම කිව්වා.

"සර්... පැක්ටරි අයිතිකාරයා අපෙන් වැඩ ගන්නවා... අපට හරි පඩියක් ගෙවන්නේ නැහැ... අපේ ශ්‍රමය සූරාගෙන කනවා... අපේ දරු පවුල් පඩගින්නේ... මේව කියන්ඩ ගියාම අපේ දෙන්නෙක් දොට්ට දැම්මා... අපි ස්ට්‍රයික් කළා..."

රූස්වෙල්ට් මේ කතාව අහගෙන ඉඳලා මෙහෙම කිව්වාව.

"ඔව්... ඒ කතාවෙත් ඇත්තක් තියෙනවා"

කම්කරුවො ගියාට පස්සෙ රූස්වෙල්ට් මහත්මිය කාර්යාල කාමරයට ආවා... එයා මේ ඔක්කොම අහගෙන ඉඳළා... නෝන මහත්තය මෙහෙම කිව්වලු...

"දූන් ඔයා පැක්ටේරි කාරයාටත් කිව්වා ඒ කතාව ඇත්තක් තියෙනවා කියලා. කම්කරුවන්ටත් කිව්වා ඒ කතාවෙ ඇත්තක් තියෙනවා කියලා. කෙළින් වචනයක් දෙන්නෙ නැතුව වැනෙනවා... ඔහොම පුළුවන්ද රටක් පාලනය කරන්ඩ...පිස්සුද මන්දා"

නෝන මහත්තය මෙහෙම කිව්වට පස්සෙ රූස්වෙල්ට් මොකද්ද දන්නවද කියල තියෙන්නෙ...

"ඒ කතාවෙත් ඇත්තක් තියෙනවා තමයි"